# කෙළි ගී



## සිසිර දිසානායක

### පන්හිඳයි පින්සලයි

''අවුරුදු ඇවිදිල්ලා ෟ'' මෙල්බර්න් ගුවන් විදුලියේ අවුරුදු ගීතයක් ප්‍රචාරය කළා. මේ වතාවේ පන්හිඳ ටයි, පින්සලටයි අවුරුදු කන්න වුණේ දෙපොළේ. ශ්‍රී ලංකා ජර්මානු කාර්මික විiලයේ ආදී ශිෂ්‍යයෝ අවුරුද්දක් ගානෙ පවත්වන අවුරුදු උත්සවයේ විස්තර ප්‍රචාරය කරන්න පින්ට ආරාධනා ලැබිලා. ඉතින් පින්, සංජය දිසානායකටයි, විල්ප්‍රඩ් සිරිවර්ධනටයි එකතු වුණ උදහැනැක්කෙම. මෙල්බර්න් ඉරිදා ගුවන් විදුලි මැදිරියේ ඉඳන් අවුරුදු උත්සවය සම්බන්ධ කරගෙන කරපු සාකච්ඡාවට පන් සහභාගී වුණේ නිමල් ඒකනායක එක්ක.

මෙදා පාර ඕස්ට්‍රේලියාවට ම අවුරුදු උත්සවයේ විස්තර ප්‍රචාරය කරන්න එස්.බී.එස්. ගුවන් විදුලියේ පාලිත ගණේවත්තයි, විජය වික්‍රම කරුණාසේනයි දෙන්නාත් ඇවිත්. මෙල්බර්න්වලට අවුරුදු ජයයි.
''ඉතින් ලැබුවා වූ අලුත් අවුරුද්ද කිරියෙන් පැණියෙන් ඉතිරේවාෟ '' කියලා අපි හැමෝම ඔබ හැමෝට ම ප්‍රාර්ථනා කරනවා.'' පින් උදේ පාන්දරම පටලවා ගත්තා''
මෙදා සැරේ අළුත් අවුරුදු අංග ගොඩයි.'' අවුරුදු කුමාරි තරඟය, එල්ලුම් ගහේ නැගීම -- සොරි ෟ සමාවෙන්න - ලිස්සන ගහේ නැගීම, පොල් අතු විවීම..''
පින් ගොත ගහන්න ගත්තා.

'ඔය පොල්ගෑමේ තරඟය, පොල් අතු විවිම එහෙමත් අවුරුදු ක්‍රීඩා හැටියට ද ගැනෙන්නෙ? පන් මැදිරියෙ ඉඳන් ඇහුවා.
''ඔව් ඉතින් දැන් ඒවා දකින්න, කියන්න නැති හන්දා ඔය හැටියට හරි කෙරෙන එක හොඳා මං හිතන්නේ. පොල් අතු පිටරටින් ගෙන්නුවා වියන්නම.'' පින් ඇඟ බේරා ගත්තා. ඒ එක්කම රබන් හඬක් ඇහෙන්න වුණා. පන්ට රබන් පදයක් කියනකල් ඉවසිල්ලක් නෑ.

''වත්ත කතත් කතත්තා
ඉඩම කතත් කතත්තා
වත්ත කතත් ඉඩම කතත්
දෙකම කතත් කතත්තා''

''එතකොට රබන් ගැහීම ක්‍රීඩාවක්ද? පින් හරස් ප්‍රශ්නයක් ඇහුවේ පන්වත් අමාරුවෙ දාන්න හිතාගෙන.
''පී.පී.ඇම්. සේනාරත්න මහත්තයාගේ ''ශ්‍රී ලංකාවේ එන ක්‍රීඩා'' පොතට රබන් ගැහීම ඇතුළත් වෙලා තියෙන්නෙ ක්‍රීඩාවක් හැටියට සැලකෙන හන්දා වෙන්න එපායැ.'' පොත අතේ තිබුණ හන්දා පන් ගොඩ ගියා.

''සරණයි සරණයි ඉරු දෙවි සරණයි
සරණයි සරණයි සඳ දෙවි සරණයි
සරණයි සරණයි මිහිකත් සරණයි
සරණයි සරණයි මේ තුන් සරණයි

පදිනා කල තරුණින් ඔන්චිල්ලා
අඳිනා වත තද කොට ඇඳපල්ලා
පදිනා වැල් දෙක බුරුල නොදෙල්ලා
සොඳිනා ගී කියමින් පැදපල්ලා''

''ඔන්චිල්ලාව-කුත් බැඳලා වගෙයි ෟ පන් මෙහා කෙළවරේ ඉඳගෙන ඇහුවේ ඔන්චිලි වාරම්වල සද්දේ ඇහිලා. ''ඔව් අපි දැන් ඉන්නෙ කඹ ඔන්චිල්ලාව නැත්තං සාමාන්‍ය ඔන්චිල්ලාව ළඟ. තව ඩිංගකින් අපි යනවා කතුරු ඔන්චිල්ලාව ගාවට. පොඩ්ඩක් අපට සම්බන්ධ වෙලාම ඉන්න පුළුවන් නේද?'' පින් ඇහුවා.

රුවැති කමල දිවගත සඟ තොසිනේ
පැවැති මෙදිය තුල අණසක දෙරණේ
බලැති ගුරුළු වාහන වැඩ වෙසෙනේ
තෙදැති විෂ්ණු දෙව් පින් ගනු බැතිනේ

ඒ කතුරු ඔන්චිල්ලා වාරම් ගීයක්.
''ඔන්චිල්ලා සම්බන්ධව දේව විශ්වාසයක් තියනවා කියන්නෙ හැබෑද?'' ඒ නිමල්.

''ඔය කියවුණ කවියෙනුත් ඒ බව පේනවානේ. විශේෂයෙන්ම කතුරු ඔන්චිල්ලාව බඳින්නෙ පත්තිනි දෙවියන්ට බාර භාර වෙලා කියලයි කියන්නේ.''
''කුඩු ඔන්චිල්ලා, බඹර ඔන්චිල්ලා, දෙපට ඔන්චිල්ලා, වැල් ඔන්චිල්ලා, යතුරු ඔන්චිල්ලා, මල් ඔන්චිල්ලා කියලා ඔන්චිල්ලා වර්ග ගණනාවක්ම තිබිලා තියෙනවා. ඒත් අද අපි දකින්නෙ කතුරු ඔන්චිල්ලාවත්, කඹ ඔන්චිල්ලාවත් විතරයි. පන් උෟණ පූර්ණය කිව්වා.

''පත්තිනි දෙවියන් පිදීම මුල් කරගෙන කෙරෙන තව කෙළියක් නොවැ අං කෙළිය. උඩු පිලයි යටි



පිලයි කියලා දෙපිලකට බෙදිලා එක සමාන අං දෙකක් දෙපිලෙන් එකට අමුණලා ඒවා බිඳීමට උත්සාහ කරන එක තමයි අං කෙළියේ ස්වභාවය....'' පන් එහෙම කියන කොට පින් එහා කෙළවරින් අං කෙළි ගීයක් ගුවනට එක් කළා.

ගොසින් බැසපුවයි දුනුකේ විලටා
විමසා බැළුවයි ඒ විල වටටා
නැත සිමි සපුමල් මේ විල අවටා
මෙතන නොවෙයි සිමි තව යන් එපිටා

පත්තිනි දේවියන් දේවිය එක්ක විවාහ වුණ පාළඟ කුමාරයාත් ගැන කියවෙන අපූරු කවි පංතියකින් එකකුයි පින් ඔය ප්‍රචාරය කළේ.
''අපේ කෙළි සෙල්ලං අතර තව සෙල්ලමක් තමයි ගුඩු පැනිල්ල. එක ක්‍රීඩකයෙක් ''චක් ගුඩු ගුඩු'' කියන ගමන් අනිත් පිලේ අය ඉන්න කොටුවට පැනලා කාට හරි ගහලා ඒ අයට අහුනොවී තමන්ගේ කොටුවට ආය පැන ගන්න එක තමයි මේ සෙල්ලම. එතකොට ඉතින් විරුද්ධ පිලේ අය අර ක්‍රීඩකයාව අල්ලා ගන්න උත්සාහ කරනවා. අල්ලා ගෙන මිරිකන ගමන් ''අරිකි ද? මිරිකි ද? කියලා අහනවා. ''අරිකි'' කියලා කිව්වොත් ආපහු යන්න අරිනවා. ''මිරිකි'' කියලා ක්‍රීඩකයා කියන්නේ තමන් කොහොම හරි සටන් කරලා බේරෙනවා කියලයි. ''කල්ලි කෙළිය'' නැත්තං ''ගෑඩු ගැහිල්ල'' වෙනමම සෙල්ලමක්'' මේවා විස්තර කරන්න නං කාලෙ මදි. ඒ වුණාට මේ කෙළි ගීය අහලා බැලුවනං.....'' පන් ගීය මැදිරියෙන් ප්‍රචාරය කරන්න නිමල් ට දුන්නා.
''ගුඩු ගුඩු තෙයියං - කොණ්ඩ පරෙයියං
බැදුමට අල්ලං - අල්ලං - අල්ලං

''අපේ බවලත් උදවියගේ ක්‍රීඩාවක් ගැනත් නොකිව්වොත් හරි නෑනේ. ඔලිඳ කවියකුත් පින් ගේ පැත්තෙන් කිව්වා නං''
''ඔලිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ?
ඔලිඳ තිබෙන්නේ බංගලි දේසේ
ගෙනත් සදන්නේ කොයි කොයි දේසේ?
ගෙනත් සදන්නේ සිංහල දේසේ
ජන ගී ගායනා තරඟයට ඉදිරිපත් වෙලා උන්නු ළමිස්සියන් තාලෙට ඔලිඳ කෙළි ගීයක් ගායනා කළා.

ඒ කාලේ අපේ කෙළි සෙල්ලම්වලට මොනතරම් ජන ගී ගායනා බැඳිලා තිබුණාද? ඒත් අද මොකද වෙලා තියෙන්නේ? ''ලනුව යටින් ඇරෝ ....'' ''ලනුව උඩින් ඇරෝ.....'' ''හතරෙ එකක් ඇරෝ....'' ''හයේ එකක් ඇරෝ....''
''ගිය පාරත් දුන්නා බැටේ. මේ පාරත් දෙනව බැටේ''

එල්ලෙ ගහල හයිය ගත්ත අපේ කොල්ලො දැන් ක්‍රිකට් ගහන්න රුසියො වෙලා..'' පින් කිව්වා.
''එහෙම තමයි. අපේ ඈයොත් ජාත්‍යන්තරයට යන්න ඕන. ගමේ දී එල්ලෙ ගහනවා, රට ගිහින් ක්‍රිකට් ගහනවා. අනික බලන්න ක්‍රිකට් වුණත් දැන් අපේ දෙයක් වෙලා. ඒ දවස්වල ආනන්ද - නාලන්ද තරගවල විස්තර ප්‍රචාරය කරපු කරුණාරත්න අබේසේකර, ප්‍රේමස්වර ඈපාසිංහ වගේ අය අලුත් සිංහල වචන පවා හදා ගත්තා. කඩුල්ල, ඉණිම, පන්දුව වගේ වචන ඒ වගේ ආව වචන'' පන් ටිකක් වචන ගැන උනන්දුයි.
''කාල වේලාවත් හරියාගෙනයි එන්නේ.'' නිමල් මැදිරියේ වෙලාව බැලුවෙ නැකතට වැඩ නවත්වන්න වගේ'' හවස් ජාමයේ වැඩ අල්ලන්නත් එක්ක අවුරුදු උත්සවය පැත්තට යන්න එපායැ.''

උත්සවයට එන වාහන හසුරවන්න යෙදිලා හිටිය සහෝදරයින්ගෙ ඉඳන් උත්සවයේ ප්‍රධාන සංවිධායක ලක්බන සහෝදරයා වෙනකල් හැමෝම එකතු වෙලා මේ කරන්නේ, කියලා නිම කරන්න බැරි තරම් වටිනා වැඩක්. අපූරු උත්සාහයක්. අවුරුදු උත්සවයේ සමාරම්භකයින් පවා සිහිපත් කරලා කෘතවේදී වුණ එක ඇත්තටම වටිනවා. අපි මේ අයට ස්තූතිවන්ත වෙන්න ඕන මේ කැපවීම පිළිබඳව'' සංජය කිව්වා.
ක්‍රිකට් උණුසුමත් උණක් වගේ පැතිරුණ මේ අවුරුදු කාලයේ සිංහල කෙළි සෙල්ලම් අලලලා සහන් රන්වලගේ තනුවකට පන් අලුතින් ලියපු ගීතයක් ලංකාවේ රූපවාහිනීවල ප්‍රචාරය වෙනවා. ලයනල් රන්වල ජන ගී කණ්ඩායම ගායනා කරන ඒ ගීතය අවුරුදු උත්සව විකාශය සමාප්ත කරමින් මේ විදියට වාදනය වුණා.

ඔලිඳ කෙළින්ටයි ආවේ - පෝරුව නෑ මෙහේ
කල්ලි කෙළින්ටයි ආවේ - කුට්ටා නෑ මෙහේ
එල්ලෙ ගහන්ටයි ආවේ - පන්දුව නෑ මෙහේ
පිල ඇහිඳින්ටයි ආවේ - කවුරුත් නෑ මෙහේ

අත්තාපල් මුත්තාපල් - දැන් මෙහෙ නෑ ඔය සෙල්ලම්
පුළුවන්නම් - හොයාපල්ලා

ඔලිඳ කෙළින්නට පන්ච දමන්නට - කෝ කෙල්ලන්
කල්ලි කෙළින්නට එල්ලෙ ගහන්නට - කෝ කොල්ලන්
ගමේ නැතේ උන් සිදාදියේ

ඒරොප්පෙ පන්නෙට පන්දු කෙළින්නට - රුසියො වෙලා
දුව පැන නටන්ට විස්කම් කරන්ට - හපන් වෙලා
අපේ එවුන් දැන් කෙරුමො වෙලා

(ලිපියේ අන්තර්ගතයට අනුව ඇතැම් චරිත හා සිද්ධීන් මනඃකල්පිත බව සළකන්න.)

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ
FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

ඔබ කනස්සල්ලෙන් ද..? පසුතැවිල්ලෙන් ද..?
ඔබට විශ්වාසදායක උපදේශක සේවාවක් අවශ්‍යයි ද?

එසේ නම්
ඔස්ට්‍රේලියානු උපදේශක සංගමයේ ලියාපදිංචි සාමාජිකාවකගෙන්
එම උපදේශක සේවය ලබාගැනීමට දැන්අවස්ථාව ඇත

- සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම සේවය
- පහසු අයකිරීම්

ශ්‍රී ලාංකික ඔබ සඳහා විශේෂයි

MPS Counselling Service
Shiromi Perera (MACA)
Mast. Couns, Grad Dip Couns, BSc

CLINIC
20/215 Betula Ave
Mill Park VIC 3082
Tel: (03) 9436 6965
Mob: 0448 829 905
Email : shiromi.p@optusnet.com.au

ACA AUSTRALIAN COUNSELLING ASSOCIATION
REGISTERED MEMBER OF THE AUSTRALIAN COUNSELLING ASSOCIATION

VCE
Chemistry, Biology & Maths
Tuition
Offered by an
Australian Qualified & Experienced Teacher

Sandya De Silva
(B. Sc., M.Sc. Dip.Ed.)

Tel: 9437 7801
Mobile: 0402 503 398

REGISTERED TEACHER OF
THE VICTORIAN INSTITUTE OF TEACHING